රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 26/2017(V)

මගේ අංකය: Pns/P8/02/16
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.02.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක : 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින්, මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2017.10.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2017, 2018.03.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2017(I), 2018.05.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2017(II), 2018.08.02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2017(III) සහ 2018.11.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2017(IV) කෙරෙහි ඔබේ අවධානය යොමු කරමි.

02. එම චක්‍රලේඛ මගින් දැක්වූ පරිදි නැවත ලියාපදිංචි වීම සඳහා ලබා දී තිබූ අවසන් දිනය 2021/07/31 දක්වා නැවත දීර්ඝ කරමි.

03. මේ සම්බන්ධව 2021/07/31 දිනෙන් පසු කරනු ලබන ඉල්ලීම් සහ පැරණි වැන්දඹු අනත්දරු අංක ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් ඔබ යටතේ සිටින සියලුම නිලධාරීන් විධිමත් පරිදි දැනුවත් කර අදාළ දිනට නියමිත පරිදි ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු බව වැඩිදුරටත් අවධාරණය කර සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා,පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය